සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක : 16 / 2025

මගේ අංකය: PPSC/ES/11/F1/06/DO-3
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
පළාත් සභා සංකීර්ණය,
නවනගරය.රත්නපුර.
2025.07. ०१

සබරගමුව පළාත් සභාවේ,

01.ප්‍රධාන ලේකම්,
02.ආණ්ඩුකාර ලේකම්,
03.සභා ලේකම්
04.සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
05.සියළුම පළාත් කොමසාරිස්වරුන් / පළාත් අධ්‍යක්ෂවරුන්,
06.දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
07.පළාත් පාලන ආයතනවල ලේකම්වරුන් වෙත,

## සබරගමුව පළාත් රාජ්‍ය සේවා සංවර්ධන නිලධාරී I ශ්‍රේණියට අදාළ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්පත් කැඳවීම - 2025 සැප්තැම්බර්

සබරගමුව පළාත් රාජ්‍ය සේවා සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වන ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව, තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් **2025 සැප්තැම්බර්** මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අයදුම්පත් කැඳවනුයේ සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන , **වර්තමානයේ සංවර්ධන නිලධාරී තනතුරේ I වන ශ්‍රේණියට උසස් වීම් ලබා සිටින නිලධාරීන්ගෙනි**. අදාළ නිලධාරීන් සංවර්ධන නිලධාරී I වන ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති නිලධාරීන් වන බවට ඔවුන්ගේ පෞද්ගලික ලිපි ගොනුව නඩත්තු කරන ආයතන ප්‍රධානීන් විසින් විභාග අයදුම්පතේ සහතික කළ යුතුය.

03. මෙම චක්‍රලේඛ ලිපිය ඔබ අමාත්‍යාංශය හෝ කාර්යාලය යටතේ සේවය කරන අදාළ නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කිරිමට ක්‍රියාකරන ලෙස මින් ඉල්ලමි. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට මෙම චක්‍රලේඛ ලිපියේ පිටපත් මේ සමඟ යවන අතර, සබරගමුව පළාතේ පළාත් පාලන ආයතනවල ප්‍රධානින් වෙතද මේ සමග මෙහි පිටපත් යවා ඇත. එබැවින් අනෙකුත් ආයතනවලට මෙම චක්‍රලේඛ ලිපිය බෙදා හැරීම සඳහා ක්‍රියා කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

04. සබරගමුව පළාත් රාජ්‍ය සේවා සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ **ඇමුණුම 04** හි සඳහන් පරිදි නිලධාරීන් විසින් අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය යුතුවේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුවේ. තමන් ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. සාමාර්ථය සඳහා විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40 % ) ලබා ගත යුතුවේ. විෂය නිර්දේශය පහත පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය | පැය 03 | 100 | 40% |

05. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය | I. ව්‍යාපෘතියක් යන්න නිර්වචනය කිරීම<br>II. ව්‍යාපෘති කළමනාකරණය<br>III. ව්‍යාපෘති චක්‍රය<br>IV. ව්‍යාපෘති පිළියෙල කිරීම සහ විග්‍රහ කිරීම<br>V. ව්‍යාපෘති ඇගයීම<br>➢ පිළිගෙවුම් කාලය<br>➢ ශුද්ධ වර්තමාන වටිනාකම<br>➢ අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය<br>➢ පිරිවැය ප්‍රතිලාභ අනුපාතය<br>➢ වාර්ෂික සාමාන්‍ය ඉපැයුම් අනුපාතය<br>VI. ව්‍යාපෘති සංවිධානය<br>VII. ඡායා මිළ යොදා ගැනීම |

06. **විභාග ගාස්තු** - විභාග ගාස්තුව වශයෙන් **රු. 600.00** ක් ගෙවිය යුතුය. පළමු වරට මෙම විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුවෙන් නිදහස් කෙරේ. එම විභාග ගාස්තුව මෙම පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) කලාප අධ්‍යාපන කාර්යාලයකට හෝ සබරගමුව පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. එසේ ගෙවන විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** ආදායම් ශීර්ෂයට බැරවන සේ ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පසුපිටෙහි නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ප්‍රාදේශීය ලේකම්වරු එම විභාග ගාස්තු අය කිරීමේදී එම මුදල් මෙම පළාත් සභාවේ ඉහතින් සඳහන් ආදායම් ශීර්ෂයට බැර කිරිම සඳහා ක්‍රියා කළ යුතු බවද මෙහිලා විශේෂයෙන් ම සඳහන් කරමි.)

07. **විභාගයට අයදුම්කිරීම** - අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2025.08.07** දින හෝ ඊට පෙර ලැබෙන සේ **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත, පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත්** භාර දිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. විභාගයට පෙනී සිටීම සඳහා පිළිගන්නා අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය, විභාගය පැවැත්වීමට දින 14 කට පෙර අයදුම්පතේ සඳහන් ලිපිනයට නිකුත් කරනු ලැබේ. මෙම චක්‍රලේඛයේ හා අයදුම්පත්‍රයේ පිටපතක් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ( www.psc.sg.gov.lk ) පළ කර ඇත.

09. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

10. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීම අදාළ සේවා ව්‍යවස්ථාව අනුව ඔබ විසින් සපුරා ගත යුතු සුදුසුකමක් වන බැවින්, **මෙම විභාගයට මුහුණදීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් දීමනා කිසිවක් ගෙවනු නොලැබේ**, තවද මෙම විභාගය පැවැත්වීම සඳහා ඉහළ පිරිවැයක් දරන හෙයින් විභාග අයදුම්කරුවන් සියළු දෙනා විභාගයට පෙනී සිටිනු ඇතැයි ද බලාපොරොත්තු වෙමි.

11. තවද විභාග වංචා සිදු කරන නිලධාරින්ගේ විභාග ප්‍රතිඵල අත්හිටුවීමට කටයුතු කරන බව කණගාටුවෙන් වුවද දන්වා සිටිමි.

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

ඩබ්.ආර්.දිනීෂා එස්.රත්නායක,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත

ආදර්ශ අයදුම්පත්‍රය

**සබරගමුව පළාත් රාජ්‍ය සේවා සංවර්ධන නිලධාරි I ශ්‍රේණියට අදාළ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම් කිරීම - 2025 සැප්තැම්බර්**

01. (අ) අයදුම්කරුගේ සම්පූර්ණ නම :-

(ආ) මුලකුරු සමඟ නම :-

(ඇ) අයදුම්කරුගේ නම ස්ථිර පත්වීම ලැබීමෙන් පසු වෙනස් කර භාවිතා කිරීමට අවසර ලබාගෙන ඇත්නම් කලින් භාවිතා කළ සම්පූර්ණ නම :-

02. ලබා ඇති ස්ථිර පත්වීම් ලිපියේ සඳහන් තනතුරු නාමය :-

03. එම ස්ථිර පත්වීම ක්‍රියාත්මක වූ දිනය :-

04. සංවර්ධන නිලධාරි I ශ්‍රේණියට ලද උසස්වීම ක්‍රියාත්මක වන දිනය :-

05. දැනට සේවය කරන කාර්යාලයේ / ආයතනයේ ලිපිනය හා දුරකතන අංකය :-

06. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :-
( කාර්යාලීය ලිපිනය සඳහන් කරන්න )

07. දුරකථන අංකය : -
- පෞද්ගලික -
- කාර්යාලයීය -

08. මීට පෙර පැවැත්වූ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට ඔබ අයදුම් කළේද ? : - ඔව් / නැත

09. එම විභාගයට පෙනී සිටියේද ? : - ඔව් / නැත

10. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- සිංහල ☐ දෙමළ ☐

11. මෙම විභාගය සඳහා අයදුම්පත් කැඳවා ඇති අංක 16 / 2025 දරණ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපියේ සඳහන් පරිදි විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :-

I. ගෙවූ විභාග ගාස්තුව රු. : -
II. එම මුදල ගෙවනු ලැබූ කාර්යාලයේ නම :-

III. ඒ සඳහා නිකුත් කළ කුවිතාන්සියේ අංකය හා දිනය :-
(විභාග ගාස්තු ගෙවීම සඳහා ලබාගත් කුවිතාන්සිය මෙම අයදුම්පත්‍රයේ පසුපිටෙහි අලවන්න)

ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.

දිනය - .............................  අයදුම්කරුගේ අත්සන : ...............................

**දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය**

ඉහත අයදුම්කරු මෙම කාර්යාලයේ / ආයතනයේ සේවය කරන, සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ I වන ශ්‍රේණියේ සංවර්ධන නිලධාරියෙකු / නිලධාරිනියක බවත්, ඔහුගේ / ඇයගේ අත්සන මා ඉදිරිපිටදී මෙම අයදුම් පත්‍රයේ සඳහන් කරන ලද බවත් සහතික කරමි.

දිනය :- ..............................

.............................................
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලනාමය
(කරුණාකර නිලමුද්‍රාව තබන්න)